## 2018 නොවැම්බර් මස සාංඝික පවුල් දින සුපුවත
## 'සමෝස ධර්මලාභය කෙරෙහි විශ්වාස කරමි'

01. ආරම්භක ප්‍රශංසාව :

පුබුදු ගී අංක 381 (නව මුද්‍රණය) 356 (පැරණි මුද්‍රණය)

"වඩිනු මැනවි මැවුම්කරු වූ සුදතුනි..."

02. ප්‍රශංසාවට යොමුව :

* ලොව වෙසෙන ජනතාව අතරින් අපි ආශිර්වාද ලත් ජනතාවක් වෙමු. මන්ද, අද මේ මොහොතට ඒකරාශි වීම පවා අපගේම ශක්තියෙන්, කැමැත්තෙන් සිදුවූවක් නොවේ. අප මෙතැනට රැගෙන ආවේ ශුද්ධාත්මයාණන් වහන්සේම ය. ශුද්ධාත්මයාණන් වහන්සේට ඉඩ දෙන තැනැත්තේ ආශිර්වාද ලද්දෙකි. පළමුව අපි පිළිගනිමු, අපගේ ජීවිත සිද්ධිවලදී ශුද්ධාත්මයාණන් වහන්සේට ක්‍රියා කරන්න ඉඩ දෙන ජනතාවක් බව.

* පසුගිය සංඝ දිනයේදී අපි භාවනා කළා භාග්‍යවත් මාතාවන් ශුද්ධාත්ම මෙහෙයවීමට ඉඩදුන් ආකාරයත්, එසේ ඉඩදීමෙන් ශුද්ධාත්මයාණන් වහන්සේ ඕතුමිය තුළ පූර්ණව ක්‍රියා කළ ආකාරයත්. දේව අම්මා තුළින් ප්‍රකාශ වූ සෑම වචනයක් සිදුකළේ ඕතුමිය තුළ වූ ශුද්ධාත්මයාණෝම ය. සුරදූතයා සැල කළ වචනය දෙවියන් වහන්සේගේ කැමැත්ත වුවද, එය කිසිදු පැකිලීමකින් තොරව භාර ගැනීමට සිත් තුළ භීතියක් ඇති වූවා නිසැක ය. ලොව සැමට රහසින්, කිසිවකුට අදහාගත නොහැකි පරිදි රහසින් ගැබ් ගැනීම නිසැක සිතින් භාර ගත්තේ ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය නිසාම ය.

* තම කුස ඔත් එකම පුතා, කිසිදු වරදක් නොකර, අසාධාරණ නඩු තීන්දුවක් මත, අපරාධ කරුවෙකු ලෙස නිරුවතින් කුරුසියේ එල්ලා සිටියදී ඒ දෙස බලා දෙවියන් වහන්සේගේම කැමැත්ත එය ලෙස භාර ගැනීම කිසිදු මනුෂ්‍ය දුවකට කළහැකි ක්‍රියාවක් ද? භාග්‍යවත් අම්මා සැබෑ මිනිස් දුවක් වුවත්, එසේ කළ හැකිවූයේ ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණව ක්‍රියාකිරීම නිසා ය.
මේ මොහොතේ අප ළඟ සිටින ශුද්ධාත්මයාණන් වහන්සේට අප වසා ගන්න ඉඩ හරිමු. දැනුවත්වම එය අත්දකිමු. දීමනා වරම් අත්දකින ප්‍රශංසාවකට ඇතුළු වෙමු.
පුබුදු ගී අංක 223 "ශුද්ධාත්මයාණෙනි // වඩින්න රැගෙන ගින්න ඔබගේ....."

03. ආපසු බැලීම :

* ගෙවී ගිය මාසය ජපමාලයේ මාසයයි. භාග්‍යවත් අම්මා සමග දිනපතා පෞද්ගලිකවත්, පවුලක් ලෙසත් සැබවින්ම ජපමාලය තුළින් එක්වීමට අවස්ථාවක් ලැබුණේද? එයම මුල් කරගෙන ප්‍රශංසාව තුළදී දෙවිඳුන් පැසසීමට හැකි වූවා ද? කුඩා කණ්ඩායම් තුළ සාංඝික කර ගන්න.

04. දවසේ සුපුවත :

* 'සමෝස ධර්මලාභය' යන වචනය අප කොපමණ වරක් උච්චාරණය කර ඇද්ද? සෑම දිව්‍ය පූජා යාගයකදීම 'සමෝස ධර්මලාභය කෙරෙහි විශ්වාස කරමි' යනුවෙන් උච්චාරණය කරන්නෙමු. ඒ උච්චාරණය සිදු කරනුයේ නිසි අවබෝධයකින් දැනුවත්වම ද? එසේ නම් කුමක්ද මේ 'සමෝස ධර්මලාභය' ? සභා මාතාව ඒ තුළින් කුමක් ගැන අප දැනුවත් කරන්නේ ද? එයින් ප්‍රකාශ කරනුයේ,

i ජයග්‍රාහී සභාව
ii දුක්විඳින සභාව
iii සටන් කරන සභාව යන සභාවන් තුන පිළිබඳව ය.

i ජයග්‍රාහී සභාව:

මෙලොව ජීවිතයේ දේව කැමැත්තට අනුව දිවි ගෙවා, මෙලොවින් සමුගෙන සමිඳු තුරුල්ලේ සුරදූත සමූහයා සමඟින් දෙවියන් වහන්සේගේ මහිමය පසසමින් ජයග්‍රහණය හිමි කරගෙන සිටින පිරිස ය.

ii දුක්විඳින සභාව:

මෙලොව ජීවිතය තුළ දේව කැමැත්තට අනුව ජීවිත ගත කිරීමේදී සිදුවූ දුබලකම්, අතපසුවීම් හේතුවෙන් ජීවිතයෙන් සමු ගැනීමෙන් පසු ඒවාට වන්දි ගෙවීමක් ලෙස කිසියම් කාලයක් දෙවි පියාණන් අභියස ප්‍රශංසා කිරීමේ මොහොත උදා වනතුරු දුකින් සිටින පිරිස ය. අප මෙම ආත්ම රැඳී සිටින ස්ථානය 'ශුද්ධිකාගිනිස්ථානය' යනුවෙන් ද හඳුන්වනු ලබයි.

iii සටන් කරන සභාව:

පවට නැම්ම ඇතිව මෙලොව උපදින මිනිසා (ගීතා 51:5) නිරන්තරයෙන්ම පාපයේ වහල්කමට ඇදී යයි. දිවි ගමනේදී යක්ෂයා, ලෝකයා, මාංශය සමග සටන් කර, දේව කැමැත්තට අනුව දිවි ගෙවමින් රාජ්‍ය සඳහා දූත ගමනක යෙදීමට ඔවුන්ට බලවත් සටනක යෙදීමට සිදුවේ. මෙලොවින් සමුගන්නා මොහොත දක්වාම ලොව කොතැනක දිවි ගෙවූවත් මේ සටනේ යෙදීමට මිනිසාට සිදුවේ.

මේ සභාවන් තුනම එකම සාංඝික ක්‍රියාදාමයකි. ජයග්‍රාහි සභාව නිරන්තරයෙන්ම සටන් කරන සභාව හා දුක්විඳින සභාව වෙනුවෙන් දෙවිඳුන් හමුවේ පෙනී සිටින අතර, සටන් කරන සභාව දුක්විඳින සභාව වෙනුවෙන් මෙලොව සිට ශුද්ධිකාගිනිස්ථානයේ සිටින දුක්විඳින ආත්මයන්ගේ ගැළවීම සඳහා යාච්ඤාවෙන් හා පුණ්‍ය ක්‍රියා මගින් ආධාර කරති. දුක් විඳින සභාව සිය සඟ සැපතට එක්වීමේ මොහොත උදා වනතුරු සටන් කරන සභාවේ ද, ජයග්‍රාහි සභාවේ ද මැදිහත්වීම බලා සිටිති.

**දානය :**

* මේ මළවුන් සිහි කරන, ඔවුන් වෙනුවෙන් දිව්‍ය පූජා ඔප්පු කරන, යාච්ඤා කරන, දාන ධර්ම දෙන මාසයයි. මෙම මාසය මළවුන් සිහි කරන මාසය වුවද, මේ මාසය ජීවත් වන සැමට ඔවුන්ගේ ජීවිත පැවතුමට ප්‍රබල ලෙස කථා කරන මාසයයි. මළවුන් නිත්‍ය සැතපීම ලබා අවසාන ය. එහෙත් ජීවත් වන අපටත් ඒ ගමන යම් දිනක, කොයි මොහොතක හෝ උදාවන බවත්, අපත් පොළොවට පස් වී යන බවත් සිහිගන්වයි.
* තෝබිත් 4:7-11 කියවන්න. මොහොතක් මේ ප්‍රකාශනය ඉදිරියේ පෙනී සිට, එය ආත්මගත කර ගන්න. කුඩා කණ්ඩායම් තුළ සාංඝික කර ගන්න.
* 'දානය' යන්න වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සාංඝික ක්‍රියාවකි. දානයක් පිළියෙල කිරීම වුවද අසල්වාසීන්, පවුලේ නෑ හිතවතුන් පිරිසක් එක්ව සිදු කරන සාංඝික ක්‍රියාවකි. නැති අසරණයින්ව තෘප්තිමත් කිරීම ද, පවුලේ සැම උස් පහත් භේදයකින් තොරව එකට හිඳ ආහාර වේලක් ගැනීම වැනි උතුම් ක්‍රියාවකි. එහෙත් අද වත්මන් සමාජය තුළ සිදුවන දානය දීම ගැන අපගේ අවධානය රැඳවිය යුතු නොවේද?
* දානය ත්‍රිවිධාකාරය. උපවාසය, යාච්ඤාව හා දන්දීම යනුවෙන් හඳුනාගත හැකිය.

| | |
|---|---|
| උපවාසය : | ඇතැම් පිරිස් නිශ්චිත කරුණක් මුල් කර ගනිමින් උපවාසයේ යෙදෙති. අදාළ උපවාස කාලය තුළදී ආහාර පාන වලින් වැලකී, කුමක් සිදු කළත් අදාළ අරමුණ සඵලමත් වනතෙක් ඒ වෙනුවෙන් යෙදී සිටීමකි. උපවාසය හේතුවෙන් ඉතිරි කර ගන්නා කුමක් වුවද, ඒවා තමන් සඳහා නොව, එය අසරණයින් සඳහා විය යුතු ය. |
| යාච්ඤාව : | යාච්ඤාව තුළින් අන් අය වෙනුවෙන් පෙනී සිටීම, ඔවුන් වෙනුවෙන් දෙවිඳුන් යැදීමද දානයකි. එය දානයක් වන්නේ හුදෙක් අප වෙනුවෙන් නොව, අන් අය සඳහා වන බැවිනි. |
| දානය : | විවිධාකාර දානයන් ඇත. ආහාර පාන ලබා දී කුසගිනි නිවීම එක් දානයකි. දුගී දුප්පතුන් සඳහා තම වත්කමින් අවශ්‍යතා සපුරාලීම, ඇතැම් විට මුදලින් ආධාර කිරීම ද දානයකි. අසරණ රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා කැපවීම ද, ඉගෙනුම ලබන අසරණ දරුවන් සඳහා ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලමින් ඉදිරියට යාමට සහයවීම ද දානයකි. |

* තෝබිත්ගේ පොතෙහි සඳහන් කරන අයුරින් දන්දීම ගැන අපගේ ක්‍රියාකාරිත්වය කෙසේ ද? **"කිසි දිළින්දෙකුගෙන් නුඹේ මුහුණ අහකට හරවා නොගත යුතුය"** මෙය අපට අදාළ වන්නේ කෙසේදැයි සිතා බැලිය යුතු ය. මන්ද එය මහෝත්තම දෙවියන් වහන්සේ ඉදිරියෙහි වඩාත් සුබදායී පූජාවක් වන බැවිනි.

* **ක්‍රිස්තුන් වහන්සේ අප වෙනුවෙන් කළ ජීවිත දානය :**
  - ශුද්ධවූ ත්‍රිත්වයේ දෙවන තැනැන් වහන්සේ දුබල මනුකයක් ගෙන මිනිස් මවකගේ කුස තුළ ජනිතවීම සිට කුරුස ගසේ ජීවිත පූජාව දක්වාම සිදුවුනේ දානයකි. පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කිරීම සඳහා ඇඳිවත පමණක් නොව සිරුරෙහි වූ අන්තිම ලේ බිංදුවත් දානය කිරීම සමිඳාණන් තුළින් සිදුවිනි.
  - සමිඳුන් ජීවිත පූජාවෙන් සිදුකළ ජීවිත දානය මෙන් ජීවිත දානය කිරීමක් අපගෙන් අද දවසේ අපේක්ෂා නොකළද, හැකි සෑම දෙයක් තුළින්ම දේව රාජ්‍යය සඳහා වැය වීම හා ඔවුන් වහන්සේගේ කැමැත්ත පමණක් ඉටුකිරීම වෙනුවෙන් වැයවීම අපට කළහැකි උසස්ම දානය වේ.
  - අප එකිනෙකාට පැවරී ඇති දූත කාර්යය සුලු දෙයක් වුවද එය දේව රාජ්‍යය සඳහා පැවරී ඇති කාර්යයක් ලෙස භාර ගෙන එය නොපිරිහෙලා ඉටු කිරීම ද දානයකි.

* **දේව රාජ්‍යය සඳහා කළහැකි, පිදිය යුතු දානය :**
  - ශු.මතෙව් 25:33-34 දානය පිළිබඳව සමිඳාණන් වහන්සේගේම වචනය එය වේ. එම නිසා අසරණයෙකුට පිළිගන්වන ආහාර වේලක්, වස්ත්‍රයක්, රෝගියෙකුට ලබා දෙන බෙහෙත් පෙත්තක්, අසරණයෙකු නිවසට කැඳවා නවාතැනක් ලබාදීම යන මේ සියල්ල දානය බව සහතික කරන සේක. මෙලොව ජීවිතයෙන් පසු සමිඳාණන් වහන්සේ අපගෙන් විමසනුයේ අපගේ බලහැකිකම්, ධනවත්කම් නොව අසරණයනට සිදුකළ දානයයි.
  - හිසට සෙවනක් නැතිවුනට නවාතැනක් ලබා දීම, එක එල්ලේම ඉටුකළ නොහැකි වුවද සංඝයක් ලෙස එක්ව අවම වශයෙන් වැසි අච්චලින් බේරී රැයක් පහන් කිරීමට රැඳී සිටිය හැකි තැනක් සොයාදීම දානයක් බව අමතක නොකළ යුතු ය.
  - දරුවන් සිටින මව්පියන් දිවා රෑ නොබලා වෙහෙස දරන්නේ ඔවුනට උසස් අධ්‍යාපනයක් ලබාදීම කෙරෙහිය. 5 වසර ශිෂ්‍යත්වය, අ.පො.ස.(සාමාන්‍ය පෙළ) හා උසස් පෙළ විභාග වලදී තම දරුවන්ට ලබා දිය හැකි උපරිම ජයග්‍රහණය ලබා දීමට නිවසට ගුරු භවතුන් කැඳවා, දහස් ගණන් මුදල් ගෙවා ඔවුන් දැනුවත් කරද්දී, පොතක්-පෑනක් මිළදී ගැනීමට නොහැකි අසරණ දරුවන්ට, පාසලට යෑමට ඇඳුමක් - සපත්තු ජෝඩුවක් සපයා දී ඔවුනට ඒ හිමිවරම ලැබීමට සහයවීම දානයක් නොවන්නේ ද?
  - මේ දිනවල ශ්‍රී ප්‍රශංසාරාමයේ වාර්ෂික ශුද්ධාත්ම මංගල මහෝත්සවය හා වෙනත් මංගල අවස්ථාවලදී දිව්‍ය යාගය සිදු කිරීමට, දෙවිඳුන් පැසසීමට මෙතෙක් භාවිතා කරන ලද වේදිකාව දිරාපත් වීම නිසා ඒ වෙනුවට අලුතින් වේදිකාවක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඇත. එය භාවිතා කෙරෙනුයේ මහෝත්තම දෙව් සමිඳාණන් වහන්සේගේ මහිමය ප්‍රකාශ කිරීම සඳහාම ය. එවැන්නක් සඳහාද ඔබට දායක විය හැකිය.

අත්දැකීමක් :

පියා නොමැති දරු තිදෙනෙකුගෙන් යුත් පවුල රැකබලා ගත්තේ මැද පෙරදිග ගෘහ සේවයේ යෙදුනු වැඩිමහල් දියණියයි. වසර 2 කට පසු නැවත සිය නිවසට පැමිණීමට සූදානම් වූ ඇය අම්මා ඇතුළු පවුලේ අයගෙන් විමසා සිටියේ තමා එන විට ගෙන ආ යුතු ත්‍යාගයන් පිළිබඳවය. දරුවන් ඔවුන්ගේ ආශාවන් ඉල්ලා සිටියත්, මව දුරකථනයට දුන් පිළිතුර වුනේ, ‘දුවේ අම්මට ගන්න ඔයා සිතා සිටින තෑග්ගට වියදම් කරන මුදල මට කවරෙක දාලා ගේන්න. ඒක මගේ අබ්බා තාත්තාට මහිමය ප්‍රකාශ කරන වේදිකාවට දීම තමා මට ඕනේ ලොකුම තෑග්ග’ යනුවෙනි. ඒ දුගී මව ගැන පියාණන් වහන්සේ කොපමණ සතුටු වෙයිද?

05. අප දෙසට (සාකච්චාව සඳහා)

* ‘සමෝස ධර්මලාභය’ ‘දානය’ යන මේවා පිළිබඳව මා මෙතෙක් දැරූ ආකල්පය කෙසේද? මා සිතා සිටි ආකාරයත්, අද මා දැනගත් ආකාරයත් මෙනෙහි කරන්න.
* අද සමාජය තුළ සිදු කෙරෙන ‘දානය’ (කේටරින් සර්විස්, තෝරා ගත් උසස් පිරිස්, උත්සව මේස) පිළිබඳ ඔබගේ ආකල්පය කුමක්ද? සැබැවින් සිදුවිය යුත්තේ කුමක්ද?
* අනාථ දරුවන් සිටින නිවාස, මහළු මව්පියන්ට රැකවරණය දෙන නිවාස ආදී ස්ථානවලට එදිනෙදා වේලත් පිරිමසා ගත නොහැකි පවුල් වෙතට මේ නොවැම්බර් මස යමක් සිදු කිරීමට පෞද්ගලිකවත්,සංඝයක් ලෙසත් අන් අය දැනුවත් කිරීමෙන් අපට සිදුකළ නොහැකිද? සාකච්චා කරන්න.

06. අවසන් ප්‍රශංසාව :

පුබුදු ගී අංක 49 “යන්න සැරසෙමු.....”

*******************************

අවධානය පිණිස :

* සියළුම මූලිකත්වය සඳහා යැදුම් සම්මන්ත්‍රණය නොවැම්බර් 10 වන සෙනසුරාදා පෙ.ව.09.30 සිට 11 වන ඉරිදා ප.ව.01.30 දක්වා ශ්‍රී ප්‍රශංසාරාමයේදී.
* පුබුදු ජාතික සුමැදි මව් රැලිය නොවැම්බර් මස 17 වන සෙනසුරාදා පෙ.ව.09.30 සිට ප.ව.04.00 දක්වා ශ්‍රී ප්‍රශංසාරාමයේදී.
* බයිබල් ඥානකාන්තිය නොවැම්බර් මස 21 බදාදා පෙ.ව.09.00 සිට 25 වන ඉරිදා ප.ව.01.30 දක්වා ශ්‍රී ප්‍රශංසාරාමයේදී.
* සුරැඳි දූවරුන්ගේ වාර්ෂික ඥානකාන්තිය නොවැම්බර් 27 අඟහරුවාදා පෙ.ව.09.00 සිට 29 වන බ්‍රහස්පතින්දා ප.ව.02.00 දක්වා ශ්‍රී ප්‍රශංසාරාමයේදී.

ස්තූතියි.